කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28

මගේ අංකය : ඩීඑම්එස්/සීඑම්/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2006.04.10

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම් සභාපතිවරුන් වෙත,

**<u>රාජ්‍ය සේවය, පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට අළුතින් බඳවාගැනීම් අත්හිටුවීම</u>**

රාජ්‍ය සේවය, පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල මාණ්ඩලික නිලධාරී, යටත් නිලධාරී සහ සුළු සේවක තනතුරු සඳහා ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත කරනු ලබන බඳවාගැනීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතු අතර පහත සඳහන් විධිවිධානවලට අනුකූලව පමණක් එම කටයුතු අද සිට ක්‍රියාත්මක කළයුතුය.

අ. විවිධ සේවාවන් තුළ උසස්වීම් ලබාදීම හෝ උසස්කිරීම් මගින් පුරප්පාඩු පිරවීම අනුමත පටිපාටීන්ට අනුකූලව සිදුකළයුතුය.

ආ. සුවිශේෂී තත්ත්වයන් යටතේ සහ අත්‍යාවශ්‍ය තනතුරු අළුතින් ඇතිකිරීම, ඒවාට බඳවාගැනීම් සිදුකිරීම මෙන්ම සේවයෙහි අවශ්‍යතාවයන් මත අතිවැදගත් තනතුරුවල පුරප්පාඩු පිරවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතිය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පවත්නා බව තහවුරු කරගෙන පමණක් සිදුකළයුතුය.

ඇ. ඉහත (අ) ට අදාලව දැනටමත් බඳවාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති තනතුරු සම්බන්ධයෙන් ද තවදුරටත් කටයුතු කළයුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතිය ද අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඇති බව ද සනාථ කර ගැනීමෙන් පසුවය.

ඇ. එලෙස අළුතින් ඇති කිරීමට හෝ පුරප්පාඩු පිරවීමට අදහස් කරනු ලබන විටක එම ඉල්ලීම අනුමතිය සඳහා ඉදිරිපත් කළයුත්තේ අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්/පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් ඒ පිළිබඳව විශේෂිත ඇගයීමක් සිදුකොට, ඒ සම්බන්ධව සෑහීමකට පත්වීමෙන් අනතුරුව, තමන් විසින් පෞද්ගලිකවම අත්සන් කරන ලද ප්‍රමාණවත් තරම් සාධාරණීකරණයක් සහ නිර්දේශයක් සමග විය යුතුය.

ඉ. විදේශ ආධාර මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලට අදාල පුරප්පාඩු 2000.12.26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 යටතේ පමණක් සිදු කළයුතුය.

02. ඉහත සඳහන් උපදෙස් පිළිපැදීම සඳහා ඔබගේ අධීක්ෂණය යටතේ ඇති සියළුම ආයතනවල ප්‍රධානීන් වෙත යොමු කරවනු ලබන බවට සහතික වන අයුරින් කටයුතු යොදවන ලෙසට ද මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

පී බී ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. විගණකාධිපති
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7. ලේකම්, මුදල් කොමිෂම